// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

අංක 2316/38 - 2023 ජනවාරි මස 26 වැනි බ්‍රහස්පතින්දා - **2023.01.26**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : KDS/KGK/4/2/(4)/2019/02/03.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/18/2019/WS/604.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කර ඇති බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :*

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර කඩවත්සතර හා ගඟවටකෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගුරුදෙණිය බටහිර (278) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කිරිමැටිය ගමෙහි පිහිටි සර්වේයර් ජනරාල් වෙනුවෙන් දිස්ත්‍රික්කයේ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් මැන සකස් කරන ලද 2022.12.30 දිනැති කැඩැස්තර සිතියම් අංක 320301 හි කලාප අංක 05 හි පත්‍ර අංක 27 හි කැබලි අංක 1 වන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.1299 ක්වූ පහත සඳහන් ඉඩම් කැබලි එක;

**01. කැබලි අංක 01**
ඉඩමේ නම : වෙට්ටිගේවත්ත; හිමිකම් කියන අය : රජය; මුල් හිමිකම් පාන්නා : ඩබ්ලිව්. ජී. යූ. ආර්. සිල්වා; ප්‍රමාණය : හෙක්ටයාර් 0.1299

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටන සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2023 අප්‍රේල් මස 04 වැනි දින පෙ.ව. 10.00ට මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2023 මාර්තු මස 27 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම් වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

**යූ. ජේ. එම්. එස්. එස්. බී. ජයසිංහ,**
ප්‍රාදේශීය ලේකම්,
මහනුවර කඩවත් සතර හා
ගඟවට කෝරළය.

2023 ජනවාරි මස 19 වැනි දින,
මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ
ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 01-0238



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : NPC/LND/ACQSN/16/1/I-II.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/11/2017/NPPD/360-II.

අංක 2226/19 හා 2021.05.04 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ *ගැසට්* පත්‍රයේ පළ කරන ලද ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තිය යටතේ ප්‍රකාශයෙහි ඉඩමේ විස්තරයෙහි 8A පිටුවෙහි සිංහල භාෂාවෙන් පළ කරන ලද දැන්වීමෙහි අනු අංක 70 යටතේ සඳහන් කැබලි අංක 193 දරන ඉඩමේ ප්‍රමාණය "හෙක්ටයාර් 0.01881" යන්න "හෙක්ටයාර් 0.1881" ලෙසත්, දකුණු මායිම "කැබලි අංක 246 සහ 242" යන්න "කැබලි අංක 246, 245 සහ 242" ලෙසත් නිවැරදි විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

**ආර්. එම්. ජී. සේනාරත්න,**
ප්‍රාදේශීය ලේකම්,
මධ්‍යම නුවරගම් පළාත.

2023 ජනවාරි මස 24 වැනි දින,
මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 01-0239

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.